

සැකසුම :- කෞශල්‍යා ගම්ලත්

ර/විද්‍යාරාජ විද්‍යාලය

බටුගෙදර



# බ්‍රිතාන්‍යයන් යටතේ ලංකාවේ ආර්ථික සහ සමාජයීය වෙනස්කම්

1948 වන තෙක්


වතු ආර්ථිකයේ
ආරම්භය හා වර්ධනය

# වතු ආර්ථිකයේ ආරම්භයට බලපෑ හේතු

1. ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය අධික වියදම් සහිත වීම නිසා ලාභ උපයා ගැනීමට ඉංග්‍රීසීන්ට නොහැකි වීම
2. එතෙක් පැවති ප්‍රධාන ආදායම් මාර්ගය වූ කුරුඳු වෙළෙඳාම අඩපණ වීම
3. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වල බලපෑම
    1. අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
    2. ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් ආරම්භ කිරීම
    3. යුරෝපීයන්ට ලංකාවේ පදිංචි වීමට හා ඉඩම් අයිති කර ගැනීමට තිබූ බාධා ඉවත්වීම
    4. පෞද්ගලික ආයෝජන වලට ඉඩදීම
    5. රජයේ වෙළෙඳ ඒකාධිකාරය අහෝසි කිරීම
4. ලංකාවේ සාර්ථකව වගා කළ හැකි භෝග පිළිබඳ අත්හදා බැලීම් සාර්ථක වීම(කෝපි)

# වතු වගාවේ දියුණුවට බලපෑ හේතු

## කෝපි වගාව

1. කෝපි ගස ලංකාවට ලන්දේසීන් විසින් හඳුන්වා දුන්නත් මධ්‍ය කඳුකරය තුළ එය අත්හදා බැලීමට හැකියාව ඉංග්‍රීසීන්ට ලැබීම.
2. ලන්ඩන් වෙළෙඳපලේ කුරුඳු මිළ පහත වැටීම නිසා රජයේ ආදායම වැඩිකර ගැනීමට මහා පරිමාණයෙන් වගා කළ හැකි භෝගයක් අවශ්‍ය වීම
3. උඩරට ප්‍රදේශයේ කෝපි වගාවේ අත් හදා බැලීම් සාර්ථක වීම.
4. කෝපි වගාවේ ආයෝජනය කරන්නන්ට රාජ්‍ය  අනුග්‍රහය ලැබීම.
5. 1840 මුඩුබිම් පනත යටතේ අයිතිය තහවුරු කළ නොහැකි ඉඩම් රජයට පවරාගෙන අඩු මිලට වැවිළිකරුවන්ට විකිණීම.
6. ලොව වෙනත් ප්‍රදේශ වල කෝපි වගාව පෙහානියට පත්වීම සමග යුරෝපයේ ලංකාවේ කෝපි වලට ඉහළ ඉල්ලුමක් හා තරගකාරී මිලක් ලැබීම.
7. දකුණු ඉන්දියාවෙන්  ශ්‍රමිකයින් ගෙන්වා අඩු මිලට ශ්‍රමය ලබා ගැනීම.
8. සාර්ථක වැවිළි ක්‍රම අනුගමනය කිරීම.

# කෝපි වගාවේ දියුණුව

- **1836 වන විට අක්කර 6000ක් වූ කෝපි වගාව 1845 වනවිට අක්කර 78000 දක්වා වැඩි වීම**





- **1847 වන විට කෝපි මිල පහත වැටුනත් 1851-1868 අතර කාලයේ නැවත මිල ඉහල යාම**

# කෝපි වගාවේ පරිහානිය






- **1868** න් පසුව හෙමීලියා වැස්ටර්ට්‍රික්ස් **(Hemilia vestartrix)** නම් කෝපි පත්‍ර වලට බලපෑ දිලීර රෝගයක් නිසා කෝපි වගාව පරිහානියට පත් වීම

# වෙනත් වගාවන් කෙරෙහි යොමු වීම

- සින්කෝනා






- මෙය ක්වීනීන් නැමති ඖෂධය නිපදවීම සදහා යොදා ගන්නා පැලෑටියක් බැවින් ඉල්ලුම අඩු වීම නිසා අසාර්ථක වීම

# වෙනත් වගාවන් කෙරෙහි යොමු වීම

- **කොකෝවා**





- කොකෝවා ගස සාර්ථකව වැවෙන බිම් ප්‍රමාණය සීමිත වීම, ලන්ඩන් වෙළෙඳපළේ හොඳ ඉල්ලුමක් නොමැති වීම, වියදම් අධික වගාවක් වීම, කෘමි රෝගයක් වැළඳීමෙන් අස්වැන්න අඩු වීම වැනි හේතු නිසා අසාර්ථක විය

# තේ වගාව

- 1839 තේ ගස ලංකාවට හඳුන්වා දෙයි.
- 19 වන සියවසේ දෙවන භාගයේ තේ වගාව ආරම්භ වේ.
- සෙසු වගා අසාර්ථක වන විට ඉංග්‍රීසීන් තේ වගාව කෙරෙහි අවධානය යොමු කරයි.
- 1867 ජේම්ස් ටේලර් නැමති ඉංග්‍රීසි ව්‍යාපාරිකයා මහනුවර හේවහැට ලූල්කඳුර අක්කර 10 ක තේ වගා බිමක් අරඹයි.





Father of the Ceylon Tea Industry
James Taylor



# තේ වගාවේ දියුණුවට බලපෑ හේතු

- කෝපි, සිංකෝනා, කොකෝවා වගා අසාර්ථක වීමෙන් පසු ව්‍යාපාරිකයන්ට තිබූ එකම විකල්පය තේ වීම.
- රජය ආදායම වැඩි කරගැනීමට තේ වගාවට දිරි දීම
- යුරෝපයේ තේ වල මිල ඉහළ යාම
- මේ වන විට මහා මාර්ග, දුම්රිය මාර්ග, වරායන් ආදී යටිතල පහසුකම් දියුණු වී තිබීම
- ඇමරිකාව, රුසියාව වැනි රටවල්ද ලංකාවේ තේ ඇණවුම් කිරීම
- ලොකයේ තේ පරිභෝජය ඉහළ යාම
- තේ වතු වල වැඩට දකුණු ඉන්දීය කම්කරුවන් යෙදවීමෙන් ලාභය වැඩිවීම
- බ්‍රිතාන්‍ය ව්‍යවසායකයින් වැඩියෙන් ආයෝජනය කිරීම හා ඔවුන්ට ඒ සඳහා පහසුවෙන් ඉඩම් ලබා ගත හැකි වීම

# තේ වගාවේ ව්‍යාප්තිය

- 1929 වන විට තේ බිම් ප්‍රමාණය අක්කර හාරලක්ෂයක් වීම
- මහනුවර,බදුල්ල, නුවරඑළිය දිස්ත්‍රික්ක වල විශාල වශයෙන් ව්‍යාප්ත වීම
- 1925 තලවකැලේ තේ පර්යේෂණාගාරය පිහිටුවීම



# තේ වගාවේ වයාප්තිය



(071) 281 0206











# පොල් වගාව

- අතීතයේ පටන් ලංකාවේ සරුසාරව වැවුණු භෝගයකි
- 19 වන සියවස මුල් භාගයේ පොල් වගාව වතු වගාවක් ලෙස ආරම්භ වේ.
- මෙහි වැඩිපුර ආයෝජනය කළේ දේශීය ධනවතුනන් ය





# පොල් වගාවේ ව්‍යාප්තිය

- මුලින්ම ඉන්දියාවට පොල් අපනයනය කල අතර පසුව යුරෝපයට පොල් තෙල් යවන ලදී.
- පොල් වගාවේ ව්‍යාතියත් සමග 1920 වනවිට විදේශීය විනිමය 27% දක්වා ඉහළ යයි
- පොල් නිශ්පාදනයෙන් වැඩිපුර ප්‍රමාණයක් දේශීය පරිභෝජනය සඳහා යොදා ගන්නා ලදී.
- 1920 දී ලුණුවිල පොල් පයේෂණ ආයතනය පිහිටුවයි.
- හලාවත සිට දෙවුන්දර දක්වා පොල් වගාව ව්‍යාප්ත වීම



# රබර් වගාව

- 19 වන සියවසේ අවසානයේදී රබර් වගාව හදුන්වා දෙයි.
- රබර් වගාවේ දියුණුවට බලපෑ සාධක
  - කාර්මික විප්ලවයෙන් පසු මෝටර් රථ කර්මාන්තය සදහා යුරෝපයේ රබර් ඉල්ලුම ඉහල යාම
  - 1 වෙනි ලෝක යුද්ධ සමයේ රබර් ඉල්ලුම ඉහළ යාම
  - රබර් යොදා භාණ්ඩ නිශ්පාදනය කිරීම වැඩිවීම



# රබර් වගාවේ ව්‍යාපෘතිය

- ලංකාවේ නිරිත දිග තෙත් කලාපය රබර්වගාවට යෝග්‍ය වීම.
- 1833 දී කළුතරින් ආරම්භ වී රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත වීම.
- 1910 වන විට රබර් වගා කර තිබූ භූමි ප්‍රමාණය අක්කර දෙලක්ෂයක් වීම.



# රබර් වගාවේ ව්‍යාප්තිය






# ප්‍රවාහනය සහ සන්නිවේදනය








වතුවගාවේ සංවර්ධනයට සාපේක්ෂව වතුවගාව සදහා අවශ්‍ය යටිතල පහසුකම් ලෙස ප්‍රවාහනය සහ සන්නිවේදනය සංවර්ධනය විය

# ප්‍රවාහනය - මහාමාර්ග

- 1831 වන විට දිවයිනේ ඉදිවී තිබූ ප්‍රධාන මාර්ග
  - කොළඹ-මහනුවර-මාතලේ-දඹුල්ල මාර්ගය
  - අඹේපුස්ස-කුරුණෑගල-දඹුල්ල මාර්ගය
  - කුරුණෑගල-මහනුවර මාර්ගය





# ප්‍රවාහනය - දුම්රිය මාර්ග

- වතුවගා නිශ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ඉදිකළ දුම්රිය මාර්ග
  - කොළඹ-නුවර මාර්ගය
  - මහනුවර-මාතලේ මාර්ගය
  - පේරදෙනිය-නාවලපිටිය මාර්ගය
  - නාවලපිටිය-නානුඔය-බණ්ඩාරවෙල මාර්ගය








# ප්‍රවාහනය-බෝට්ටු සේවය

- ඉන්දියාවේ දුම්රිය සේවය හා සම්බන්ධ කරමින් තලෙයිමන්නාරමේ සිට ධනුෂ්කොඩි තෙක් බෝට්ටු සේවයක් ඇරඹීම



# සන්නිවේදනය - තැපැල් සේවය

- **1832 දී අශ්ව කෝච්චි තැපැල් සේවය ආරම්භ කිරීම**
- **1838 දී තැපැල් රථ සේවය ආරම්භ කිරීම**
- **දුම්රිය ආරම්භ කිරීමෙන් පසු තැපැල් දුම්රිය සේවාව ආරම්භ කිරීම**
- **මුද්දර භාවිතය ආරම්භ කිරීම**










# සන්නිවේදනය - ටෙලිග්‍රාෆ් ක්‍රමය

- කොළඹ සමග ගාල්ල, මහනුවර, ත්‍රිකුණාමලය, යාපනය යන නගර සම්බන්ධ කරමින් ඇති කළ මෙම ක්‍රමය 20වන සියවස තුළ විශාල දියුණුවක් ලබයි.



# දේශීය කර්මාන්ත

- කුරුඳු කර්මාන්තය
  - මුලින් කුරුඳු කර්මාන්තය රජයේ ඒකාධිකාරයක් බවට පත්වී තිබීම
  - එකල එය වෙනම දෙපාර්ත්මේන්තුවක් යටතේ ක්‍රියාත්මක වීම
  - පසුව 1833 කෝල්බෘක් යෝජනා අනුව එහි රජයේ අධිකාරිය අවලංගු කිරීම



# දේශීය කර්මාන්ත

- මුතු කිමිදීම
  - කුරුඳු වලින් පසුව බ්‍රිතාන්‍යයන් වැඩිම ආදායම ලැබූ කර්මාන්තය වීම
  - මුතු කිමිදීමේ අයිතිය වෙන්දේසිකිරීම
  - මුතුපර ආරක්ෂා කිරීමට වෙනම නිලධාරියෙකු අත් කිරීම



# දේශීය කර්මාන්ත

- ලුණු කර්මාන්තය

  - මුලින් ලුණු ඒකාධිකාරය රජය සතු වීම
  - ඉන්දියාවට පවා ලුණු අපනයනය කිරීම
  - ඒකාධිකාරය යටතේ ලුණු නිශ්පාදනය අඩපණ වූයෙන් කෝල්බෘක් ලුණු ඒකාධිකාරය අවලංගු කිරීම



# දේශීය කර්මාන්ත

- දුම්කොල කර්මාන්තය
  - උතුරේ වගාකරන ලදි
  - රජයේ වෙළෙඳ ඒකාධිකාරය යටතේ විශාල ආදායමක් ලැබීම
- පුවක් කර්මාන්තය
  - පුවක් වලින් ලැබූ තීරු බදු හොද ආදායම් මාර්ගයක් වීම
  - 19 සියවසේ රේගු ආදායමෙන් ¼ ක් පුවක් වලින් ලැබීම
- ගම්මිරිස්, කරදමුංගු, රා, අරක්කු, මිනිරන්
  - බ්‍රිතාන්‍ය රජයේ ආදායම් මාර්ග බවට පත්වීම






# දේශීය කෘෂිකර්මාන්තය

- වතුවගාවට මුල් තැන දීම නිසා යැපුම් කෘෂිකර්මාන්තය අභාවයට යාම
- ගොවිතැන් කටයුතු වලට රජයේ අනුග්‍රහය නොලැබීම
- පීඩාවට පත් ජනතාව 1848 ඉංග්‍රීසි විරෝධී සටනට එකතු වීම
- එම සටනින් පසු ඇතැම් ආණ්ඩුකාරවරු දේශීය කෘෂිකර්මාන්තය කෙරෙහි අවධානය යොමු කිරීම
  - හෙන්රි වෝර්ඩ්, හර්කියුලිස් රොබින්සන්, විලියම් ග්‍රෙගරි වැනි ආණ්ඩුකාරවරු වාරිමාර්ග දියුණු කිරීම



# අධ්‍යාපනය

- පැරණි දේශීය පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය පිරිහී යම
- පෘතුගීසි , ලන්දේසි කාලවල පැරිස් පාසල් ආරම්භ වී තිබීම
- ඉංග්‍රීසි සමයේ මිෂනාරි පාසල් ආරම්භ වීම
- සිංහල , දෙමළ , ඉංග්‍රීසි මාධ්‍ය තුනෙන්ම අධ්‍යාපනය ලබා දීම
- කෝල්බෘක් ප්‍රතිසංස්කරණ වලින් ඉංග්‍රීසි මාධ්‍ය පාසල් බිහිකිරීම
- ස්වභාෂා පාසල් පරිහානියට පත් වීම
- මැකන්සී පාලන සමයේ පාසල් පද්ධතිය පුළුල් වීම
- මෝර්ගන් කමිටුව මගින් පාසල් වර්ග කිහිපයක් හදුන්වා දීම
- විශ්ව විද්‍යාල ආරම්භ කිරීම

# නිදහස් අධ්‍යාපනය

- 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා විසින් අධ්‍යාපනය නොමිලේ ලබාදීමට කටයුතු කිරීම
- ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලබාදීම
- මධ්‍ය විද්‍යාල ආරම්භය
- ගුරු පුහුණු ආයතන හා ගුරුවරුන්ට රජයෙන් වැටුප්
- ප්‍රායෝගික අධ්‍යාපනය සහ ශිෂ්‍යත්ව ක්‍රමය
- දෙවන බස ඉංග්‍රීසි සහ ආගම විෂය අනිවාර්ය කිරීම
- දරුවන්ට දිවා ආහාරය, පාසල් සෞඛ්‍ය සේවය, වැඩිහිටි අධ්‍යාපනය ඇරඹීම



Dr. C.W.W. Kannangara



# සමාජයීය වෙනස්කම්

- පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව ප්‍රභූ පන්තියක් බිහිවීම
- බදු රේන්ද මිලට ගැනීමෙන්, වතු වගාවට අවශ්‍ය සේවා සැපයීමෙන් හා වතු මිලට ගැනීමෙන් බිහිවූ මෙම නව ප්‍රභූ පන්තිය ධනවතුන් ( මධ්‍යම පන්තිය) බවට පත්වීම
- ඔවුන් තම දරුවන්ට උසස් හා විදේශීය අධ්‍යාපනය ලබා දීමෙන් උගත් මධ්‍යම පන්තිය බිහිවීම
- නව රැකියා බිහිවීම
- ඉංග්‍රීසි අධ්‍යාපනය ව්‍යාප්ත වීම නිසා යුරෝපා සංස්කෘතිය ගරු කරන ස්වදේශිකයන් පිරිසක් බිහිවීම
- අඩු වේතනයට ශ්‍රමය ලබාදෙන වතු කම්කරු පිරිසක් හා නාගරික කම්කරු පිරිසක් බිහිවීම
- වෘත්තීය සංගම් ව්‍යාපාර බිහිවීම